# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,164 - 2020 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 802 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 802 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 මාර්තු මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## වයඹ පළාත් සභාව

### 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1984 අංක 37 දරන විනෝද බදු (සංශෝධන) පනතින් සංශෝධිත 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ ප්‍රකාශිත විනෝද කටයුතු සඳහා අයකරනු ලබන ඇතුළුවීමේ ගාස්තුවෙන් 10%ක විනෝද බද්දක් පනවා අය කිරීමට 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(1) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නාරම්මල ප්‍රාදේශීය සභාව විසින් 2019.06.11 දින මහ සභා යෝජනා අංක 05.01 යටතේ සම්මත කර ඇති යෝජනාව, වයඹ පළාතේ ගරු ආණ්ඩුකාරවර සුදසිංහ මුදියන්සේලාගේ පේෂල ජයරත්න බංඩාර වන මම, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1946 අංක 12 දරන විනෝද බදු ආඥාපනතේ 2(2) වගන්තියේ විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

සුදසිංහ මුදියන්සේලාගේ පේෂල ජයරත්න බංඩාර,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2019 නොවැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

02-472

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සහන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය - 2020

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ සහන නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය සඳහා, අයදුම්පත් කැඳවන දිනට බස්නාහිර පළාතේ පූර්වාසන්න වසර 3 ක අඛණ්ඩ ස්ථිර පදිංචිය සහිත පහත සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

1. *අධ්‍යාපන සුදුසුකම්.*- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම.

2. *වෘත්තීය සුදුසුකම්.*- අදාළ නොවේ.

3. *පළපුරුද්ද.*- අදාළ නොවේ.

4. *කායික සුදුසුකම්.*- බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

5. *වැටුප.*- මෙම තනතුරට හිමි වැටුප් කේත අංකය MN 4- 2016 වේ.

   *වැටුප් පරිමාණය.*- රු. 31,490 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - රු. 54,250 (රා. පරි. ච. 03/2016 අනුව)

6. *සේවා කොන්දේසි .*- මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු ය. අනුමත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

7. *බඳවා ගැනීමේ ක්‍රමය.*- ලිඛිත පරීක්ෂණයේ දී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් විවෘත ධාරාව යටතේ 70% බඳවා ගනු ලැබේ.

8. *ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :*

   ලිඛිත පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |

*විභාග විෂය නිර්දේශය :*

| | |
|---|---|
| සාමාන්‍ය දැනීම | ජාතික කලාපීය හා සමස්ත ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ මෙන්ම ශ්‍රී ලංකාවේ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාල වෙනත් සාධකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |
| බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය, ගණිත කුසලතාවන් හා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ ඇගයීමේ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |

09. *පොදු සුදුසුකම් :*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
ii. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.
iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන 2020.03.23 දිනට පූර්වයෙන් බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර 03 ක අඛණ්ඩ ස්ථිර පදිංචිය තිබිය යුතුයි.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.
v. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතු ය. (දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු තනතුරේ ස්ථිර කරන ලද නිලධාරීන් සඳහා ඉහත උපරිම වයස් සීමාව අදාල නොවේ.)
vi. බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

10. *විභාග ගාස්තු :*

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතු ය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600 කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ අලවා තිබිය යුතු ය. එහි ඡායා පිටපතක් ලග තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

11. *අයදුම් කිරීමේ ක්‍රමය :*

*(අ)* අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතු ය. අංක 01 සිට 05 තෙක් ඡේදයන් පළමු පිටුවට ද, අංක 06 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතු ය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*(ආ)* සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2020.03.23 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ''**ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජනජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය**'' යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ සහන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය**'' යන්න පැහැදිලි ලෙස සඳහන් කර එවිය යුතු ය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

*(ඇ)* අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 07 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතු ය.

12. *විභාගයට ඇතුළ්වීම :*

*(අ)* නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේ දී ම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපෙක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*(ආ)* විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයින් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය :

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

15. *විභාග ක්‍රමය :*

(i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින්ම පිළිතුරු ලිවිය යුතු ය.
(ii) මෙම විභාගය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වනු ලබන ඉදිරි දිනයක දී පවත්වනු ලැබේ.

16. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

17. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

18. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත.

19. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය වන /නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

20. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2020 පෙබරවාරි මස 10 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ සහන නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය - 2020**

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

(විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E
[ ]

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................

(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................
..........................................

(උදා. : H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 ස්ථිරව පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................

2.2 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව :..........................................

03. 3.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................
..........................................

ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................
..........................................

3.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/ දෙමළෙන් :..........................................
..........................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :..............................................................................................................

..............................................................................................................

2.4 දුරකථන අංකය :

ස්ථාවර : | | | | | | | | | | |   ජංගම : | | | | | | | | | | |

❖ විභාගය සම්බන්ධ සියලු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මගින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.

04. ස්ත්‍රී / පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

පුරුෂ - [ ]   ස්ත්‍රී - [ ]

05. 5.1 විවාහක/අවිවාහක බව - (විවාහක -2, අවිවාහක : 1) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

5.2 උපන් දිනය :- වර්ෂය : | | | | |   මාසය : | | |   දිනය : | | |

5.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :........................ මාස :........................ දින :........................

06. උපාධිය පිළිබඳ විස්තර (උපාධි සහතිකයේ හා විස්තරාත්මක සහතිකයේ (Detailed Certificate) පිටපත් ඇමිණිය යුතුයි.)

i. ලබා ඇති උපාධිය :..............................................................................................................
ii. උපාධියේ දී හදාරන ලද විෂයයන් :..............................................................................................................
iii. විශ්වවිද්‍යාලයේ නම :..............................................................................................................
iv. උපාධි සහතිකය වලංගු දිනය :..............................................................................................................

07. 7.1 දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු තනතුරේ ස්ථිර කරන ලද අයෙක් ද? ඔව්/නැත
7.2 පිළිතුර''ඔව්'' නම් දැනට දරන තනතුර :..............................................................................................................
7.3 සේවා ස්ථානය :..............................................................................................................
7.4 සේවයට පත් වූ දිනය :..............................................................................................................
7.5 සේවය ස්ථිර කළ දිනය :..............................................................................................................

08. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..............................................................................................................
ලදුපත් අංකය :..............................................................................................................
දිනය :..............................................................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න. |
|---|

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ. ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

09. *අයදුම්කරුගේ සහතිකය :*

.............................................................................................................. වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ සහන නිලධාරී III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට හැකි බව මම හොඳාකාරවම දනිමි.

....................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...................................

10. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය .......................... වැනි දින මා ඉදිරිපිටදී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

.........................................................
අත්සන සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :.........................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :.........................................................................
තනතුර :.........................................................................
ලිපිනය :.........................................................................

*අත්සන සහතික කිරීම :*

(අයදුම්පතේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලය ලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුයි. අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 498,960 වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු, පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරනු ලැබිය යුතු ය.)

11. *දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා :*

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.................................................................................................... මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ (ස්ථිර තනතුර) ..................................................................... වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

...................................................................................
(ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව)

දිනය :.........................................................................
තනතුර :.........................................................................
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :.................................................

02-523

---

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරීන් සේවා ගණයේ සංස්කෘතික නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ සංස්කෘතික නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත තරග විභාගය සඳහා, අයදුම්පත් කැඳවන දිනට පූර්වයෙන් බස්නාහිර පළාතේ අවම වශයෙන් වසර 3 ක ස්ථිර පදිංචිය සහිත පහත සුදුසුකම් ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *අධ්‍යාපන සුදුසුකම්.-* විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලලිත කලාවේ දී සාමාන්‍ය/විශේෂ උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේ දී උපාධිය හෝ දෘශ්‍ය කලාවේ දී උපාධිය හෝ සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ විෂයයක් ප්‍රධාන විෂය වශයෙන් පවත්නා ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් ලබා තිබීම.

2. *වෘත්තීය සුදුසුකම්.-* අදාළ නොවේ.

3. *පළපුරුද්ද.-* අදාළ නොවේ.

4. *වැටුප.-* මෙම තනතුරට හිමි වැටුප් කේත අංකය MN4- 2016 වේ.
වැටුප් පරිමාණය.- රු. 31,490 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 5 x 750 - 54,250 (රා. පරි. ච. 03/2016 අනුව)

5. *සේවා කොන්දේසි.-* මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වන අතර විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය. අනුමත බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව සේවා කොන්දේසි තීරණය වේ.

6. *බඳවා ගැනීමේ ක්‍රමය.-* ලිඛිත පරීක්ෂණයේදී ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙල මත සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව විවෘත ධාරාව යටතේ 100% බඳවා ගනු ලැබේ.

7. ලිඛිත පරීක්ෂණයේ විෂය නිර්දේශය :

ලිඛිත පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40% |
| අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |

*විභාග විෂය නිර්දේශය.-*

| | |
|---|---|
| සාමාන්‍ය දැනීම | දේශීය හා විදේශීය වශයෙන් වැදගත් වන කාලීන සිද්ධීන් පිළිබඳ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි |
| අභියෝග්‍යතාව | අපේක්ෂකයාගේ තර්කානුකූල ශක්තිය, විශ්ලේෂණ හා සංස්ලේෂණ හැකියාව මැනෙන පරිදි සකස් වන ප්‍රශ්න පත්‍රයකි. |

08. *පොදු සුදුසුකම්:*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
ii. අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.
iii. අයදුම්පත් භාර ගන්නා අවසාන දින වන 2020.03.23 දිනට පූර්වයෙන් බස්නාහිර පළාත තුළ අවම වශයෙන් වසර 03 ක ස්ථිර පදිංචිය තිබිය යුතුයි.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
v. අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුය. (දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු තනතුරේ ස්ථිර කරන ලද නිලධාරීන් සඳහා ඉහත උපරිම වයස් සීමාව අදාල නොවේ.)
vi. බස්නාහිර පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

09. *විභාග ගාස්තු.-*

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600 කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරග නු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙනසේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

10. *අයදුම් කිරීමේ ක්‍රමය.-*

*(අ)* අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 05 තෙක්

ඡේදයන් පළමු පිටුවටද, අංක 06 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

*(ආ)* සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2020.03.23 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ''**ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 628, 10 වන මහල, ජනජය සිටි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය**'' යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ සංස්කෘතික නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය**'' යන්න පැහැදිලි ලෙස සඳහන් කර එවිය යුතුය. අයදුම්පත් භාරගන්නා දිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් භාරගනු නොලැබේ.

*(ඇ)* අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේනිල වෙබ් අඩවිය වන www.psc.wp.gov.lk වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 07 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

11. *විභාගයට ඇතුළ්වීම :*

*(අ)* නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර. එසේ පෙනී සිටින පළමු දිනයේදීම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

*(ආ)* විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

12. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.-*

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයින් විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :*

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාග යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මේ සම්බන්ධව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ 47 වගන්තිය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

14. *විභාග ක්‍රමය :*

(i) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින්ම පිළිතුරු ලිවිය යුතු ය.
(ii) මෙම විභාගය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දන්වනු ලබන ඉදිරි දිනයකදී පවත්වනු ලැබේ.

15. මෙම විභාගයෙන් සුදුසුකම් ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත.

16. නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති, සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

17. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේ ද පළ කර ඇත.

18. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් ආවරණය වන /නොවන ඕනෑම කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

19. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2020 පෙබරවාරි මස 10 වැනි දින.

### ආදර්ශ අයදුම්පත්‍රය

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ සංස්කෘතික නිලධාරී III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය

විභාග අංකය : ☐

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T ☐
ඉංග්‍රීසි - E

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................

(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමග අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................

..........................................................

(උදා. : H.M.S.K. GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :..........................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 ස්ථිරව පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................................

2.2 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව :..........................................................

03. 3.1 ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................................

..........................................................................................

ස්ථිර ලිපිනය : (සිංහලෙන්/ දෙමළෙන්) : ..........................................................................................

..........................................................................................

3.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/ දෙමළෙන් :..........................................................................................

..........................................................................................

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :..........................................................................................

..........................................................................................

3.3 දුරකථන අංකය :

ස්ථාවර : | | | | | | | | | | |     ජංගම : | | | | | | | | | | |

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මගින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.

04. ස්ත්‍රී / පුරුෂ භාවය - (අදාළ කොටුව තුළ "√" ලකුණ යොදන්න.)

පුරුෂ - [ ]   ස්ත්‍රී - [ ]

05. 5.1 විවාහක/අවිවාහක බව - (විවාහක -2, අවිවාහක : 1) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

5.2 උපන් දිනය :- වර්ෂය : | | | | |   මාසය : | | |   දිනය : | | |

5.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු :......................... මාස :......................... දින :.........................

06. උපාධිය පිළිබඳ විස්තර (උපාධි සහතිකයේ හා විස්තරාත්මක සහතිකයේ (Detailed Certificate) පිටපත් ඇමිණිය යුතුයි.)

i. ලබා ඇති උපාධිය :..........................................................................................
ii. උපාධියේ දී හදාරණ ලද විෂයයන් :..........................................................................................
iii. විශ්ව විද්‍යාලයේ නම :..........................................................................................
iv. උපාධි සහතිකය වලංගු දිනය :..........................................................................................

07. 7.1 දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ, සේවයේ නියුතු තනතුරේ ස්ථිර කරන ලද අයෙක් ද? ඔව්/නැත
7.2 පිළිතුර''ඔව්'' නම් දැනට දරන තනතුර :..........................................................................................
7.3 සේවා ස්ථානය :..........................................................................................
7.4 සේවයට පත් වූ දිනය :..........................................................................................
7.5 සේවය ස්ථිර කළ දිනය :..........................................................................................

08. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :..........................................................................................
ලදුපත් අංකය :..........................................................................................
දිනය :..........................................................................................

| ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙනසේ අලවන්න. |
|---|

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ. ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

09. *අයදුම්කරුගේ සහතිකය :*

........................................................................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ආශ්‍රිත නිලධාරී සේවා ගණයේ සංස්කෘතික නිලධාරී III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට හැකි බව මම හොඳාකාරවම දනිමි.

.....................................................;
අයදුම්කරුගේ අත්සන.

දිනය :..................................

10. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................................................................. මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය ........................... වැනි දින මා ඉදිරිපිටදී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

...........................................................;
අත්සන සහතික කරන්නාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :........................................................................
සහතික කරන්නාගේ සම්පූර්ණ නම :..........................................................................
තනතුර :.........................................................................
ලිපිනය :.........................................................................

*අත්සන සහතික කිරීම :*

(අයදුම්පතේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලය ලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුයි. අපේක්ෂකයාගේ අත්සන, රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ආයතන ප්‍රධානියා හෝ බලය පැවරූ නිලධාරියකු විසින් ද, සෙසු අපේක්ෂකයන්ගේ අත්සන් රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 498,960 වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන්වහන්සේ කෙනෙකු, පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරනු ලැබිය යුතුය.)

11. *දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූවන් සඳහා :*

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

.................................................................................................. මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ (ස්ථිර තනතුර) ...................................................................... වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බව දන්වමි.

..............................................................................;
(ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව)

දිනය :.......................................................................
තනතුර :...................................................................
ආමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :.................................................

02-524

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018

2019.06.07 වැනි දින පළ කරන ලද *ගැසට්* නිවේදනය අවලංගු කිරීම

වයඹ පළාතේ පළාත් සභා පාසල්වල පවතින ඉංග්‍රීසි භාෂා ගුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 (ඇ) ශ්‍රේණියට දිස්ත්‍රික් පදනම මත ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම සඳහා 2019.01.26 දින පැවති ලිඛිත විභාගය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර තිබූ අංක SCFR 228/2019 නඩුවේ සමථ තීරණය අනුව කටයුතු කිරීම සඳහා ''2019.01.26 දින පැවැති ලිඛිත විභාගය අවලංගු කිරීම'' යන මාතෘකාව යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,127 දරන 2019.06.07 දිනැති *ගැසට් පත්‍රයේ* IV (අ) පළාත් සභා කොටසේ, 06-534 යටතේ පළ කරන ලද ගැසට් නිවේදනය මෙයින් අවලංගු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

පද්මිණි කාරියවසම්,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල,
2020 පෙබරවාරි මස 14 වැනි දින.

02-672

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.